# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — 896 / 2022

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2022.06.17 පැය 1915

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ගාලු මුවදොර සහ විරෝධතා පැවැත්වෙන ප්‍රදේශය ආශ්‍රිතව සිදුවන අපරාධ සම්බන්ධව.**

පසුගිය මාස 02ක ආසන්න කාලය තුල ගාලු මුවදොර සහ විරෝධතා පැවැත්වන ප්‍රදේශයේ සිදුව ඇති අපරාධ සම්බන්ධයෙන් කොටුව පොලිස් ස්ථානයට මේ වන විට පැමිණිලි රාශියක් ලැබී ඇත. මෙම අපරාධ අතර යතුරුපැදි සොරකම් කිරීම්, ත්‍රීරෝද රථ සොරකම් කිරීම්, ජංගම දුරකථන සොරකම් කිරීම් සහ මුදල් සොරකම් කිරීම් ද දක්නට ඇත.

ඒ වගේම පුද්ගලයන් අතර ඇතිවන ආරවුල් නිසා පහරදීම් පිළිබදවද වාර්තා වී ඇති අතර 2022.06.16 වන දින රාත්‍රියේදී ද ගාලු මුවදොර ප්‍රදේශයේ පුද්ගලයන් දෙදෙනෙකු ඇතිකරගත් ආරවුලක් මත එක් අයෙකු පහරදීම නිසා පහරකෑමට ලක් වූ පුද්ගලයා රෝහල් ගතවී ඇති අතර, පහරදුන් පුද්ගලයා කොටුව පොලිස්ථානය මගින් අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගත් සැකකරු මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවෙකු බවට පොලිසිය සැකකරන අතර ඒ පිළිබදව කොටුව පොලිස්ථානය විසින් විමර්ශන පවත්වයි.

ගාලු මුවදොර හා විරෝධතා ප්‍රදේශවල සැරි සැරීමේදී වඩා කල්පනාකාරීව කටයුතු කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**